# මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික -අර්ධ ශිල්පීය සේවා ගණයෙහි (PL 2- 2006 A) සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය - සංශෝධන අංක 01

| ඡේද අංකය | දැනට තිබෙන පෙළ | ඡේද අංකය | යෝජිත සංශෝධනය | සංශෝධනයට හේතු |
|---|---|---|---|---|
| 3.3 | පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය: සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් ආයතනයන්හි කාර්යයන් ඉටු කිරිම හා පවත්වා ගෙන යාමේදි අවශ්‍ය වන මූලික පහසුකම් සම්පාදනයට අදාළ වන උපස්ථායක සේවය, ඉදිකිරිම, නඩත්තු හා අලුත්වැඩියා වැනි කාර්යයන් අතුරින් තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තිය කුසලතාවයන්හි ( N.V.Q ) දෙවන හෝ තුන්වන මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා/ කාර්මික නිපුණතාවන් අවශ්‍ය වන්නා වූ කාර්යයන් මෙම සේවා ගණයට පැවරේ. මෙම කාර්යයන් අතුරින් පත්කිරිම් බලධාරියා ඒ ඒ තනතුරට අදාළව විශේෂ කොට සකස්වනු ලබන කාර්යයන් තනතුරට පැවරේ. | 3.3 | පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය: සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් ආයතනයන්හි කාර්යයන් ඉටු කිරිම හා පවත්වා ගෙන යාමේදි අවශ්‍ය වන මූලික පහසුකම් සම්පාදනයට අදාළ වන උපස්ථායක සේවය, ඉදිකිරිම, නඩත්තු හා අලුත්වැඩියා වැනි කාර්යයන් අතුරින් තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තිය කුසලතාවයන්හි ( N.V.Q ) දෙවෙනි හෝ තුන්වෙනි මට්ටමේ ප්‍රවීණතා / කාර්මික නිපුණතාවන් අවශ්‍ය වන්නා වූ කාර්යයන් මෙම සේවා ගණයට පැවරේ. මෙම කාර්යයන් අතුරින් පත්කිරිම් බලධාරියා ඒ ඒ තනතුරට අදාළව විශේෂ කොට සකස්වනු ලබන කාර්යයන් තනතුරට පැවරේ. | ජාතික වැටුප් කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක NPC/10/71/3/SR හා 2014.01.20 දිනැති ලිපිය මඟින් ලබා දී ඇති නිරීක්ෂණ අනුව. |
| 4 | තනතුරෙහි/ තනතුරුවල ස්වභාවය: ස්ථිර විශ්‍රාම වැටුප් සහිත වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුපකට දායක විය යුතුය. | 4 | තනතුරෙහි/ තනතුරුවල ස්වභාවය : ස්ථිර විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය. | |
| 7.3.3.6 | සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා -<br>මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව. | 7.3.3.6 | සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා-<br>මධ්‍යම පළාත් සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් | |
| 10.1.2<br><br>10.1.2.1 | සුවිශේෂී කාර්ය සාධනය අනුව,<br><br>සපුරාලිය යුතු සුදුසුකම් යටතේ,<br>1. පත්වීම ස්ථිර කර තිබීම.<br>2. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර හය (6) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක හය (6) ම නියමිත දිනට උපයාගෙන තිබීම.<br>3. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර හය (6) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.<br>4. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.<br>5. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව නියමිත කාලය තුළදී ලබාගෙන තිබීම.<br>6. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම. | | සුවිශේෂී කාර්ය සාධනය යටතේ, උසස්වීම ලබාදීම පිළිබඳව අමාත්‍ය මණ්ඩලය මඟින් ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නා තෙක් මෙම විධිවිධාන ඇතුළත් නොකිරීමට තීරණය කර ඇති බැවින් දැනට තිබෙන 10.1.2, 10.1.2.1, 10.1.2.2යන ඡේද ඉවත් කෙරේ.<br><br>ගරු ආණ්ඩුකාරතුමිය විසින්<br>2015.09.10 දින<br>අනුමත කරන ලදී.<br>ආණ්ඩුකාර ලේකම් | |

<table>
<tr><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>

**10.1.2.2** 10.1.2.2. උසස් කිරීමේ ක්‍රමය

ඉහත සුදුසුකම් සපුරාලන සේවකයන්ට පත් කිරීම් බලධරයා අනුමත කරන ආයතනයක් විසින් පවත්වනු ලබන ලිඛිත අභියෝගාත්මක පරීක්ෂණයකට පෙනී සිටිය හැක. ඉන් සමත්වන්නන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත් කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත් කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ. අදාළ සෙසු අවශ්‍යතාවයන් ද සම්පූර්ණ කර ඇති සේවකයන් පත් කිරීමේ දින සිට වසර හය (06) ක් සම්පූර්ණ වන දිනට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත් කිරීමේ බලධරයා විසින් සිදු කරනු ලැබේ. ලිඛිත අභියෝගාත්මක පරීක්ෂණය - ඇමුණුම - 10

<u>සටහන</u>

- සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීම් ලබා දීමේදී පවත්වනු ලබන පරීක්ෂණයෙන් සමත්වීම සඳහා අවම වශයෙන් ලකුණු 60% ක් ලබාගත යුතුය. තවද, සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීමේ පරීක්ෂණය වර්ෂයකට එක් වරක් පවත්වනු ලබන අතර සේවකයෙකුට පෙනී සිටිය හැක්කේ එක් වතාවක් පමණි.
- සේවකයෙකුට පාලනය කළ නොහැකි විශේෂ හේතුවක් මත නියමිත දිනට සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීමේ පරීක්ෂණයට පෙනී සිටීමට නොහැකි වූ අවස්ථාවන්හි දී පසුව පැවැත්වෙන අභියෝගාත්මක පරීක්ෂණයට එම සේවකයාට පෙනී සිටිය හැක. එවැනි සේවකයෙකු සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීම සිදුකරන දිනය ලෙස සලකනුයේ එම විභාගය සමත් වූ දින වේ.

</td><td></td><td></td><td></td></tr>
<tr><td>

10.2.2 සුවිශේෂී කාර්ය සාධනය අනුව

10.2.2.1 සපුරාලිය යුතු සුදුසුකම්

1. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර අට (8) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක අට (8) ක් නියමිත දිනට උපයාගෙන තිබීම
2. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර අටක් (8) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
3. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
4. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම.
5. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

</td><td></td><td>

සුවිශේෂී කාර්ය සාධනය යටතේ, උසස්වීම් ලබාදීම පිළිබඳව අමාත්‍ය මණ්ඩලය මඟින් ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නා තෙක් මෙම විධිවිධාන ඇතුළත් නොකිරීමට තීරණය කර ඇති බැවින් දැනට තිබෙන 10.2.2, 10.2.2.1, 10.2.2.2 යන ඡේද ඉවත් කෙරේ.

ගරු ආණ්ඩුකාරතුමිය විසින්<br>
2015.09.10 දින<br>
අනුමත කරන ලදී.<br>
ආණ්ඩුකාර ලේකම්

</td><td></td></tr>
</table>

**10.2.2.2 උසස් කිරීමේ ක්‍රමය**

සුදුසුකම් සපුරාලන සේවකයින් සඳහා පත් කිරීම් බලධරයා විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලබන අතර, එම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් 50% ක් හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා සේවකයින් II ශ්‍රේණියට උසස් වී වසර අට (08) ක් සම්පූර්ණ වන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම පත් කිරීමේ බලධරයා විසින් සිදු කරනු ලැබේ. (ඇමුණුම 11)

<u>සංලක්ෂය</u>

1. සුවිශේෂී කාර්ය සාධන ඇගයීමේ ක්‍රමවේදයක් රජය විසින් හඳුන්වා දී ක්‍රියාත්මක කරන තෙක් දැනට ක්‍රියාත්මක වන වාර්ෂික කාර්ය සාධන ඇගයීමේදී සතුටුදායක මට්ටම හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කරනු ලැබ ඇති තැනැත්තන්ට සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීම සඳහා වන ලිඛිත අභියෝග්‍යතා පරීක්ෂණය / ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටීමට අවස්ථාව සලසා දෙනු ලැබේ.

2. සාමාන්‍ය කාර්ය සාධනය අනුව උසස් කිරීමේ දි නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම් සමත් නොවන සේවකයන්ගේ උසස් වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම් සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

2015.07.14 දිනැති කොමිෂන් සභාවේ නිර්දේශය

| <u>නම</u> | | | <u>අත්සන</u> |
|---|---|---|---|
| 01. | ගාමිණී දසනායක මහතා | (සභාපති) | |
| 02. | යූ.ඒ. බෝගහපිටිය මහතා | (සාමාජික) | |
| 03. | ජී.ජී.එස්.ඒ. දිසානායක මහත්මිය | (සාමාජික) | |
| 04. | වී. නන්දකුමාර් මහතා | (සාමාජික) | |
| 05. | ඒ.ජේ.එම්.එම්. නිස්තාර් මහතා | (සාමාජික) | |

මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය

අනුමත කරමි/~~නොකරමි~~

සුරංගනී එල්ලාවල
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර
2015/09/10